**<u>Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විරුද්ධව හිජාස් ඔමර් හිස්බුල්ලා සහා සලීම්කාන් මොහොමඩ් ශාකීල්* (පාස්කු ප්‍රහාරය හා එහි පසුබිම් සිදුවීම් සබැඳිව ගොණු කරන ලද නඩුවකි.)

**Case no (නඩු අංකය):** HC 78/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2022 ඔක්තෝම්බර් මස 04 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | නදී අපර්ණා සුවන්දුරුගොඩ විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් | |
| **Police (CID / TID etc.) (පොලිසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | ඉරු දෙව්දාස් මහතා (CID) | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. හිජාස් ඔමර් හිස්බුල්ලා<br>2. සලීම්කාන් මොහොමඩ් ශාකීල් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | පළමු චූදිත වෙනුවෙන් නීතිඥ හෆීල් ෆාරිස්, නීතිඥ ෂෙහානි වත්සලා, ජනාධිපති නීතිඥ නලින්ද ඉන්ද්‍රතිස්ස මහතා පෙනී සිටින ලදී.<br><br>දෙවන චූදිත වෙනුවෙන් නීතිඥ විනාෂ්වරී ජයතිලක, නීතිඥ ක්‍රිෂානි වත්සලා, නීතිඥ චමින්ද අතුකෝරල පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |

| | | |
|---|---|---|
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන්, නීතිඥ සංගමයෙන් නීතිඥ රංජන් පෙරේරා මහතා පැමිණ සිටියේය. | |

**2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?**

පැමිණිලිකාර පාර්ශවය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් පෙනී සිටීමට නියමිතව තිබූ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම මහත්මිය සහ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදශර්න් ද සිල්වා මහතා අධිකරණයට පැමිණ නොතිබිණි. ඒ අනුව නීතිපති දෙපාතර්මේන්තුව වෙනුවෙන් රජයේ නීතිඥ නිමේශා ද අල්විස් මහත්මිය පෙනී සිටිමින්, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ලක්මිණී ගිරිහාගම මහත්මිය කොළඹ පිහිටි ත්‍රිපුද්ගල මහාධිකරණයක මෙදින පෙනී සිටින බැවින්ද එම නඩුව අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල ගැනීමට නියමිත බැවින්ද, මෙදිනද අඟහරුවාදා දිනයක් වන බැවින් මෙම නඩුවට මෙදින සහභාගි වීමට නොහැකි බව දැනුම් දී ඇති බැවින් ඉදිරි දිනයක් ඉල්ලා සිටින ලදී.

කෙසේ නමුත් ඒ සඳහා විත්ති පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් විරෝධතාව දක්වන ලදී. එම විරෝධතා වලදී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ව්‍යවස්ථාපිතවම එම නඩු විභාග සඳහා ප්‍රමුඛත්වය දී නඩු ගතයුතු බව සඳහන්ව ඇති පසුබිමක පෙර දිනයේදීත් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම මහත්මිය අධිකරණමය හෝ පුද්ගලික කාරණයක් නොවන කරුණක් දක්වා පැමිණීමට නොහැකි බව දැක්වූ බවත්, මූලික සාක්ෂි විමසීම එකම දිනයේ දී දෙදෙනකු විසින් සිදුකර ඇති පසුබිමක හරස් ප්‍රශ්න ඇසීම සඳහා ඉන් එක් කෙනෙකු හෝ නොපැමිණීම යන්න ද හුවා දක්වන ලදී. රජයේ නීතිඥ තුමියගේ කරුණු දැක්වීම් වල දී ඇය සතුව මෙම නඩුවෙහි නඩු ගොනුව ද නොමැති බව දක්වන ලදී. සියලු පාර්ශවයන්ගේ කරුණු විමසූ මහාධිකරණ විනිසුරුතුමිය රජයේ නීතිඥ තුමිය අතෙහි නඩු ගොනුව නොමැති වීම නිසා හරස් ප්‍රශ්න ඇසීමෙන් පැමිණිල්ලට අගතියක් විය හැකි නිසාත්, මෙම නඩුවේ නඩු විභාගයට දින ලබා දීමේදී ත්‍රිපුද්ගල මහාධිකරණ නඩුව පිළිබඳ දැන සිටියේ නැති බව පෙනී යන නිසාද චූදිතයන්ට අගතියක් නොවන පරිදි කෙටි දිනයක් ලබාදෙන ලෙස දන්වා සිටිය ද නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරුන් ලබාදී ඇති නිදහස් දින (free dates) අනුව මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා 2022 වර්ෂයේ නොවැම්බර් මස 25 වන දිනට කැඳවීමට නියම කරන ලදී.

එමෙන්ම මෙම නඩුව විමර්ශන අවස්ථාවේ දී පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සහ 2 කොටුව මහේස්ත්‍රාත්වරයාගේ නිල මැදිරිය තුළ කරන ලද රහස් ප්‍රකාශය ජනමාධ්‍ය වෙත අනාවරණය වී ඇත. ඒ සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශයට ලබාදී ඇති ප්‍රකාශය ඇතුළත් මුල් තොරතුර අධිකරණයට ගෙන එන ලෙසද විනිසුරුතුමිය නියෝග කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2022 නොවැම්බර් මස 25

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**

- https://m.facebook.com/story.php?story_fbid=pfbid09EQjSWMpVqDHM1QsoUBjyE8knpyjYfdf5Wo5sQHqBneZs2C5KDFMdCGDamMmZd3Gl&id=100084454436600&mibextid=Nif5oz

- https://www.facebook.com/100000568041748/posts/pfbid02TxwVVdKRRCuVfEL5M9jb4NQYaJ1afz7QfKTdgZSKREsf9jmRch2xwqZz7SNBZxvAl/?mibextid=Nif5oz
- https://twitter.com/hejaazh/status/1577315330535428096?t=di5hFTPWY3JLjxnOZ64hsA&s=08
- https://twitter.com/Justice4Hejaaz/status/1577310773243961344?t=ugAYLEMGAYJw3d7UX-T59A&s=08